## 4.0 තාක්ෂණික **ක්ෂේත්‍ර** හතරට අදාළ නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය, ඉගෙනුම් ඵල හා කාලච්ඡේද සංඛ්‍යාව

| තාක්ෂණික ක්ෂේත්‍රය | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 01. කෘෂිකර්මය | 1.0 පවතින සම්පත් යොදා ගනිමින් වගා භූමිය සංවර්ධනය කරයි. | 1.5 ගෙවතු වගාවට අදාළ ව්‍යාපාරික අවස්ථා ක්‍රියාත්මක කරයි. | • ගෙවත්තක ආදායම් උපදවන කෘෂි නිෂ්පාදන හා සේවා<br>• ව්‍යාපාරයක් කරා යාමේ අවසාන දැක්ම<br>• වෙළෙඳපොළ ඉල්ලුම පිරික්සීම<br>• ආදායම උපදවන කෘෂි නිෂ්පාදන හා සේවා<br>• පිරිවැය ප්‍රතිලාභ සැසඳීම<br>• මූලික යෙදවුම්, නඩත්තු වියදම හා ආදායම<br>• මූලික සැලැස්ම තීරණය<br>• කෘෂි නිෂ්පාදන අලෙවි ඒකක<br>• කාබනික බෝග<br>• කොළ එළවළු<br>• වෙනත්<br>• තවාන් පැළ නිෂ්පාදනය<br>• අගය වැඩි කළ නිමි නිෂ්පාදන<br>• භූමි අලංකරණ සැලසුම් හා නිමැවුම්<br>• සිටුවා ඇති පලතුරු බෝග පුනරුත්ථාපනය<br>• වාර්තාකරණය<br>• මූල්‍ය/වගා පාලනය<br>• නම් කරනු ලබන වෙබ් අඩවි පරීක්ෂා කර නව කෘෂි ව්‍යවසායකත්ව තොරතුරු හා මිල ගණන් පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීම | • ආර්ථික වශයෙන් ලාභ ලැබිය හැකි සුළු පරිමාණයේ ගෙවතු ව්‍යාපාර හඳුනා ගනියි.<br>• යෙදවුම්, කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිමැවුම් සැලසුම් කරයි.<br>• කෘෂි නිෂ්පාදන හා සේවා සපයයි.<br>• නම් කරනු ලබන වෙබ් අඩවි පරීක්ෂා කර තොරතුරු හා ක්‍රියාකාරකම් අත්හදා බලයි. | 23 |
| | 2.0 ජෛව පරිසරය සුරැකීමට දායක වෙයි. | 2.4 පරිසර හිතකාමී බව රැක ගනිමින් කෘෂිකාර්මික කටයුතු පවත්වා ගෙන යයි. | • පාරිසරික වෙනස් වීම්වල අහිතකර බලපෑම් අවම කිරීම හා අනුවර්තනය සඳහා හරිත කෘෂි තාක්ෂණික විසඳුම්<br>• බෝග පාලනය වෙනුවට පස සුරැකීම හා පෝෂණය<br>• පටු ජාන සංයුතිය සහිත නව ප්‍රභේද වෙනුවට ප්‍රවේණි උරුම බෝග වගාව<br>• හායනය වෙමින් පවතින සීමිත සම්පතක් වූ ජලය කාර්යක්ෂම ව භාවිතය<br>• හරිත ආවරණය ඉහළ නැංවීම හා වන ජීවී මිත්‍රශීලී පරිසරයක් සඳහා වූ වගා රටා | • පරිසරය හා කෘෂිකාර්මික කටයුතු සඳහා බලපවත්නා ගැටලු හඳුනා ගනියි.<br>• පාරිසරික ගැටලු අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග යෝජනා කරයි.<br>• කෘෂිකාර්මික කටයුතු මගින් හිතකර පරිසරයක් නිර්මාණය කළ හැකි කාර්යයන්හි නිරත වෙයි. | |

| තාක්ෂණික ක්ෂේත්‍රය | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| | | | • අපද්‍රව්‍ය සම්පත් බවට පත් කිරීම<br>• පළිබෝධ පාලනය උදෙසා කෘත්‍රිම රසායනික වෙනුවට පරිසර හිතකාමී විකල්ප ශිල්පීය ක්‍රම<br>• සුනිත්‍ය බලශක්ති ප්‍රභව භාවිතය | | |
| 2.0 ආහාර | 5.0 ආහාර මූලික කර ගත් කර්මාන්ත අවස්ථා හඳුනා ගනිමින් ව්‍යාපාර සැලසුම් කරයි. | 5.2 ආහාර මූලික කර ගත් කර්මාන්ත සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය අත්හදා බලයි. | • ආහාර මූලික කර ගත් වෙළෙඳපොළ අවස්ථා<br>• දේශීය /විදේශීය සංචාරකයින්<br>• දේශීය ආහාර ප්‍රවර්ධනය<br>• ප්‍රමිති/පිරිවිතර<br>• ගුණාත්මකභාවය<br>• ආකර්ෂණීයභාවය<br>• සැලසුම් කිරීම<br>• අලෙවිකරණ ප්‍රමාණය<br>• නිෂ්පාදන ක්‍රියාවලි<br>• සුදුසු මෘදුකාංග ඇසුරින් ව්‍යාපෘති සැලසුම<br>• අවශ්‍ය උපකරණ හා ඇටවුම්<br>• සැකසීමේ සහ පරීරක්ෂණය කිරීමේ තාක්ෂණ<br>• සැපයුම් දාමය<br>• ඒකක නිෂ්පාදන පිරිවැය | • ආහාර හා සබැඳි කර්මාන්ත පැවැත්ම කෙරෙහි බලපාන සාධක විමසා බලයි.<br>• ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම සඳහා සුදුසු මෘදුකාංග යොදා ගනියි.<br>• සැපයුම් දාමය පිළිබඳ සැලකිලිමත් වෙමින් නිෂ්පාදන ක්‍රියාවලිය සැලසුම් කරයි.<br>• ආහාර මූලික කර ගත් කර්මාන්තයෙහි යෙදීම සඳහා සූදානම ප්‍රදර්ශනය කරයි. | 22 |
| | | 5.3 ආහාර කර්මාන්තය නගා සිටුවීම සඳහා ආහාර විවිධාංගී-කරණයෙහි යෙදෙයි. | • කාර්ය පහසු කිරීමේ උපකරණ හා ඇටවුම් නිර්මාණ<br>• ආහාර විවිධාංගීකරණයේ දී පාරිභෝගික ආකර්ෂණය ඇති කරන සාධක<br>• උත්තේජනය<br>• රසය<br>• වයනය<br>• පැහැය<br>• හැඩරුව<br>• ආහාරමය අගය<br>• පෝෂණය<br>• සෞඛ්‍යාරක්ෂිත බව<br>• ඇසුරුම්කරණය<br>• ආහාර සඳහා ප්‍රමිති<br>• පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රියාවලි<br>• වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම. | • ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපකරණ හා ඇටවුම් නිර්මාණය කරයි.<br>• විවිධ ආහාර නිර්මාණ ඉදිරිපත් කිරීම මගින් පාරිභෝගික ආකර්ෂණය වැඩි දියුණු කිරීමට සැලසුම් කරයි.<br>• පරිසර හිතකාමී නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කරයි. | |

| තාක්ෂණික ක්ෂේත්‍රය | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 3.0 ආරම්භක තාක්ෂණ-වේදය | 6.0 තාක්ෂණික කාර්යයන් සපුරා ගැනීම සඳහා මූලික අත් ආවුද/උපකරණ හා ද්‍රව්‍ය ආරක්ෂිත ව හා මනාව යොදා ගනියි. | 6.7 සරල තාක්ෂණික සේවා ඉටු කිරීමේ කාර්යාවබෝධය හා හසුරු කුසලතා මනාව පෙන්වයි. | • පාසල් ප්‍රජාවට අවශ්‍ය තාක්ෂණික සේවා සැපයීම<br>• සේවා අවශ්‍යතාව හඳුනා ගැනීම<br>• පිරිවිතර<br>• ප්‍රමාණ<br>• සැලසුම් සටහන්<br>• තාක්ෂණික ශිල්ප ක්‍රම සහ ක්‍රියාවලිය සැලසුම් කිරීම<br>• සැලසුම් චිත්‍ර<br>• උපකරණ , ආවුද හා ඇටවුම්<br>• ද්‍රව්‍ය<br>• තාක්ෂණික ශිල්ප ක්‍රම නියාමක අධ්‍යයන (pilot study) සහ ඇගයීම<br>• සංවර්ධන සැලසුම් හා යෝජනා සම්පාදනය | • පාසල් ප්‍රජාවට අදාළ ව තාක්ෂණික සේවා අවශ්‍යතා විමසා බලයි.<br>• අපේක්ෂිත නව්‍ය තාක්ෂණික ක්‍රමවේද භාවිතයෙන් සැලසුම් සකස් කරයි.<br>• තෝරා ගත් සේවා සැපයීමක් ආරම්භ කර සාර්ථක කර ගනියි. | 23 |
| | 7.0 එදිනෙදා හමු වන ගැටලු සඳහා සැලසුම්ගත ව තාක්ෂණික විසඳුම් ලබා දීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 7.4 එදිනෙදා අවශ්‍යතාවට අනුව භාවිතයට ගත හැකි භාණ්ඩ/ ඇටවුම් සැලසුම් කර නිර්මාණය කරයි. | • විවිධ කාර්ය හා සම්බන්ධ නිර්මාණ අවශ්‍යතාව හඳුනා ගැනීම<br>• උචිත නිර්මාණ ක්‍රියාවලිය<br>• විවිධ තාක්ෂණික ක්ෂේත්‍ර සංකලනය වන නිර්මාණ<br>• නිර්මාණයේ සාර්ථකත්වය සඳහා සලකා බැලිය යුතු සාධක<br>• පිරිවිතරවලට අනුකූල බව<br>• නඩත්තුව පහසු වීම<br>• පරිසර හිතකාමී බව<br>• අමු ද්‍රව්‍ය පහසුවෙන් සපයා ගත හැකි බව<br>• පාරිභෝගික ආකර්ෂණය | • ප්‍රායෝගික ව තැනිය හැකි අවශ්‍යතාවට ගැළපෙන නිර්මාණ සංකල්ප තෝරා ගනියි.<br>• නිර්මාණයට අදාළ ව වෙළෙඳපොළ විභව්‍යතාව හා ඉල්ලුම විමසා බලයි.<br>• සැලසුමට අනුව නිර්මාණ සංකල්පය නිෂ්පාදිත යථාර්ථයක් බවට පත් කරයි.<br>• නිර්මාණ පිළිබඳ තොරතුරු සන්නිවේදනය සඳහා සුදුසු මෘදුකාංග භාවිත කරයි. | |

| තාක්ෂණික ක්ෂේත්‍රය | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 4.0 ව්‍යාපාර කටයුතු | 9.0 කුඩා ව්‍යාපාර සැලසුම් කර පවත්වා ගෙන යයි. | 9.8 සාර්ථක ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා බලපාන සාධක හඳුනා ගනිමින් ව්‍යවසායක ගති ලක්ෂණ පිළිබඳ ස්ව තක්සේරුවක යෙදෙයි. | • සැලසුම් කිරීම<br>  • ද්‍රව්‍ය, උපකරණ, අවකාශය හා අනෙකුත් යෙදවුම් තෝරා ගැනීම<br>  • ක්‍රියාකාරී සාධ්‍යතාව සනාථ කර ගැනීම<br>  • ඒකකයක් සඳහා නිෂ්පාදන වියදම ගණනය<br>  • සංවර්ධන යෝජනා<br>  • නිර්මාණය පිළිබඳ තොරතුරු සන්නිවේදනය සඳහා මෘදුකාංග භාවිතය<br><br>• ව්‍යාපාරික සාර්ථකත්වයට බලපාන සාධක<br>  • මුදල් , ශ්‍රමය , ද්‍රව්‍ය හා වෙනත් සම්පත්<br>  • තාක්ෂණික දැනුම<br>  • තොරතුරු<br>  • වෙළෙඳපොළ<br>  • ශක්තීන්<br>  • අවස්ථා<br>• ව්‍යවසායක පුද්ගල චරිත ඇසුරින් ව්‍යවසායක ගති ලක්ෂණ හඳුනා ගැනීම.<br>  • නායකත්වය<br>  • නවෝත්පාදන හැකියා<br>  • කැපවීම<br>  • වගකීම<br>  • තීරණ ගැනීම<br>  • අවදානම් දැරීම<br>  • ගැටලු විසඳීමේ හැකියාව<br>• අදාළ සාධක සහ ව්‍යවසායක ගති ලක්ෂණ වර්ධනය කර ගැනීමට අවශ්‍ය පියවර යෝජනා කිරීම<br>• ව්‍යවසායකයෙකු වීමේ අරමුණ සහ ස්ව තක්සේරුව | • ව්‍යාපාරයක් අරඹා පවත්වා ගෙන යාම සඳහා බලපාන සාධක පෙළ ගස්වයි.<br>• සාධකවල අදාළ බව අත්හදා බලයි.<br>• ව්‍යවසායක ගති ලක්ෂණ හඳුනා ගෙන ස්ව තක්සේරුවක යෙදෙමින් යෝජනා ඉදිරිපත් කරයි. | 22 |

| තාක්ෂණික ක්ෂේත්‍රය | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| | | 9.9 කුඩා ව්‍යාපාරයක් පවත්වා පසු විපරම් කර ප්‍රතිපෝෂණ යෝජනා ඉදිරිපත් කරයි. | • කුඩා ව්‍යාපාර සැලසුම් කිරීම සහ ලාභදායී ලෙස පවත්වා ගෙන යාම.<br>• ව්‍යාපාරයේ පරිමාණය තීරණය<br>• නිෂ්පාදන සැලැස්ම<br>• ව්‍යාපාර සංවිධානය<br>• මූල්‍ය සැලැස්ම<br>• වෙළෙඳ සැලැස්ම<br>• ව්‍යාපාර ආචාර ධර්ම<br>• ව්‍යාපාර නීති රීති<br>• උපකාරක සේවා යොදා ගැනීම<br>• බැංකු සේවා<br>• ප්‍රවාහනය<br>• රක්ෂණය<br>• සන්නිවේදනය<br>• ප්‍රචාරණය<br>• ගිණුම් කටයුතු පවත්වා ගැනීම<br>• ලැබීම් හා ගෙවීම් වාර්තා<br>• ආදායම් හා වියදම් වාර්තා<br>• අතිරේක ආයෝජන අවස්ථා<br>• බැංකු තැන්පතු<br>• කොටස් වෙළෙඳපොළ<br>• වෙනත් | • සරල ව්‍යාපාර සැලසුම් සකස් කර කුඩා ව්‍යාපාරයක් අරඹයි.<br>• ව්‍යාපාර ආචාර ධර්ම හා නීති රීතිවලට අනුකූල ව ව්‍යාපාරය පවත්වා ගෙන යයි.<br>• ව්‍යාපාර කටයුතුවල යෙදී ප්‍රගතිය මැන බලා වැඩි දියුණුව සඳහා යෝජනා ඉදිරිපත් කරයි. | |